රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 21/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.

1988 ජූලි මස 13 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානයන් වෙත.

**ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටිය දී තුවාල ලබන/නිත්‍ය වශයෙන් ආබාධිත වන රජයේ නිලධරයන්ට/පළාත් පාලන සේවකයන්ට/රාජ්‍ය සංස්ථා සේවකයන්ට වෛද්‍යාධාර දීමනා/වන්දි ගෙවීම සහ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් මරණයට පත්වන එවැනි නිලධරයන්ගේ/සේවකයන්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීම**

1985.06.19 දින අංක. 296 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය වෙ[illegible] චක්‍රලේඛය ආදේශ කෙරේ.

02. රජයේ නිලධරයකුට, පළාත් පාලන සේවකයකුට, රාජ්‍ය සංස්ථා සේවකයකුට, ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටිය දී-

(අ) තුවාල[illegible]වීම වෙනුවෙන් ගෙවිය යුතු වෛද්‍යාධාර දීමනාව,

(ආ) එම නිලධරයකු නිත්‍ය වශයෙන් ආබාධිත තත්ත්වයට පත්වීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල, සහ

(ඇ) එම නිලධරයකුගේ මරණයේ දී ඔහුගෙන් යැපෙන්නන්ට ගෙවිය යුතු වන්දි මුදල පහත දැක්වේ.

(අ) ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටිය දී තුවාල ලැබ තවදුරටත් සේවයේ රඳවා ගත් රජයේ නිලධරයකුට, පළාත් පාලන සේවයේ සේවකයකුට හෝ රාජ්‍ය සංස්ථා සේවකයකුට ගෙවිය යුතු වෛද්‍යාධාර දීමනාව

I. රජයේ රෝහලකට ඇතුලත් කරන ලදුව තුවාල "බරපතල" ගණයට වර්ග කරනලද අයකුට (උපරිමය රු. 10,000/= ක් දක්වා) වහාම රු. 3000/= ක මූලික ගෙවීමක් සහ එතැන් සිට නිලධරයා නැවත සේවයට පැමිණෙන දිනය නොඉක්මවා මසකට රු. 500/= බැගින් වූ මුදලක්.

II. තුවාල "තරමක් බරපතල" ගණයට වර්ග කරන ලද නම් ඉහත (I) හි සඳහන් කොන්දේසිය මත රු. 6000/= නොඉක්මවන මුදලක්.

III. තුවාල "බරපතල" හෝ "තරමක් බරපතල" හෝ ගණයට වර්ග නොකරන ලද නම් වහාම රු. 3000/= ක මුදලක්.

සටහන :- තුවාල තවර ගණයට අයත් වේ ද යන්න පිළිබඳ වාර්තාවක් ලඟම සිටින රජයේ වෛද්‍ය නිලධාරියාගෙන් ලබාගෙන, නිලධරයා දෙපාර්තමේන්තු ප්‍රධානයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටිය දී නිත්‍ය වශයෙන් ආබාධිත වන රජයේ නිලධරයකුට, පළාත් පාලන සේවකයකුට, රාජ්‍ය සංස්ථා සේවකයකුට ගෙවීම්.

1. ආබාධිත තත්ත්වයට පත්වූ දිනයට පසුව ගෙවනු ලබන වැඩිවීම් හා දීමනා ද ඇතුළුව, තුවාල ලබන අවස්ථාවේ ඔහු ලැබූ සම්පූර්ණ වැටුප සහ දීමනාව ඔහු වයස අවුරුදු 55 ට එළඹෙන තෙක් ගෙවීම.

II. පහත දැක්වෙන පරිදි, ඉපැයීමේ හැකියාව හානි වීමේ ප්‍රතිශතය පදනම් කරගෙන, රු.100,000/= ප්‍රතිශතයක් ලෙස ගණන් බලා වන්දි මුදලක් වශයෙන් සානුකම්පිත දීමනාවක් ගෙවීම.

ඉපැයීමේ හැකියාව 20% කින් හානි වූ විට රු.20,000/=
ඉපැයීමේ හැකියාව 40% කින් හානි වූ විට රු.40,000/=
ඉපැයීමේ හැකියාව 60% කින් හානි වූ විට රු.60,000/=
ඉපැයීමේ හැකියාව 80% කින් හානි වූ විට රු.80,000/=
ඉපැයීමේ හැකියාව 100 % කින් හානි වූ විට රු.100,000/=

සටහන :- (I) ඉහත ගෙවීම් සඳහා සුදුසුකම් ලැබීමට තුවාල වර්ග කිරීම, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පත්කරන වෛද්‍ය මණ්ඩලය කරනු ඇත.

(II) (අ) වෛද්‍ය මණ්ඩලයක් පත්කරන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානයා ප්‍රදේශයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගෙන් වහාම ඉල්ලා සිටිය යුතුය.

(ආ) වෛද්‍ය මණ්ඩලය, තුවාල වර්ග කරමින් සිය වාර්තාව දෙපාර්තමේන්තු ප්‍රධානයා වෙත යැවිය යුතුය.

(ඇ) ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරි ඉටුකිරීමේදී අති විශේෂ තත්ත්වයන් යටතේ මරණයට පත්වන රජයේ නිලධරයකුගේ, පළාත් පාලන සේවකයකුගේ, රාජ්‍ය සංස්ථා සේවකයකුගේ යැපෙන්නන්ට වන්දි ගෙවීම.

1. මියගිය නිලධරයා ජීවත්ව සිටිමින් සේවයේ රැඳී සිටියේ නම්, ඔහුට වරින් වර ලද හැකිව තිබූ වැඩිවීම් සහ දීමනා ද ඇතුළුව, ඔහු මරණයට පත්වූ දිනයේදී ඔහුට ගෙවන ලද සම්පූර්ණ වැටුප හා දීමනාව, ඔහු ජීවත්ව සිටියේ නම් වයස අවුරුදු 55 ට එළඹෙන තෙක් ගෙවීම.

( 3 පිටුව

II. පහත දැක්වෙන පරිදි බෙදී යන සේ රු.150,000/= ක උපරිමය දක්වා වූ සානුකම්පිත දීමනාවක් ගෙවීම.

(1) බිරිඳ - රු.75,000/=
දරුවන් - වයස අවුරුදු 18 ට අඩු දරුවකු වෙනුවෙන් රු.18,750/= බැගින් සමප්‍රමාණිත දීමනාවක්.

(2) බිරිඳ මියගොස් ඇත්නම් - අවුරුදු 18 ට අඩු එක් දරුවකුට රු.37,500/= බැගින් දරුවන් සඳහා ගෙවීම.

සටහන:- (අ) ඉහත (1) හා (2) යටතේ අර්ථලාභීන් මුළු ගණන 4 ක් විය යුතුය. සුදුසුකම් ලබන දරුවන් සංඛ්‍යාව 4 ඉක්මවයි නම්, මුදල සියළුම දරුවන් අතර අනුප්‍රමාණිකව බෙදිය යුතුය.

(ආ) මියගිය නිලධරයා අවිවාහකයෙක් නම් ඔහුගේ දෙමව්පියන්ට රු.75,000/=ක මුදලක් ගෙවනු ඇත. දෙමව්පියන්ගෙන් එක් අයෙක් මියගොස් ඇත්නම්, ජීවත්ව සිටින මවට හෝ පියාට හෝ දෙමව්පිය දෙදෙනාම මියගොස් ඇත්නම් යැපෙන්නන්ට හෝ මුළු මුදලම ගෙවිය යුතුය.

(ඇ) යැපෙන්නෝ නම්, ඔවුන්ගේ ආදායම කුමක් වුවත් දෙමව්පියන් හා, නිලධරයා වයස අවුරුදු 55 ට එළඹීමට මත්තෙන් දෙමව්පියන් මියගියේ නම්, අවුරුදු 18 ට අඩු ඔහුගේ සහෝදරයෝ ද, රැකියා විරහිත අවිවාහක සහෝදරියෝ ද වෙති.

03. ඉහත සඳහන් ගෙවීම් කළයුත්තේ පවත්නා හිමිකමකට අතිරේකවය.

04. පහත දැක්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.296 සඳහන් කර ඇති සෑම තැනකම ඒ වෙනුවට අංක: 21/88 දරණ මෙම චක්‍රලේඛය ආදේශ කළයුතුය.

86.11.18 දින අංක.351
87.05.11 දින අංක.369
88.04.25 දින අංක.14/88

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,